# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 43 දරන
# ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 නොවැම්බර් මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 නොවැම්බර් මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල : රු. 1.50 යි. තැපැල් ගාස්තුව : රු. 1.15 යි.

# 1988 අංක 43 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 නොවැම්බර් මස 24 වන දින]

එල්. ඩී—ඕ. 49/83අ

**1982 අංක 6 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1988 අංක 43 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. *(කෙටි නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.)*

**2.** මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1982 අංක 6 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *(1982 අංක 6 දරන පනතේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

"(ආආ) රූපවාහිනී ග්‍රාහක යන්ත්‍ර ආනයනය කිරීමේ, විකිණීමේ, නිෂ්පාදනය කිරීමේ හෝ කොටස් එකලස් කිරීමේ ව්‍යාපාරයේ යෙදී සිටින තැනැත්තන් ලියාපදිංචි කිරීම ;".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *(ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

(1) ඒ වගන්තියේ (ක) සහ (ග) ඡේද වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :—

"(ක) රූපවාහිනී ප්‍රචාරය පිළිබඳ කුසලතා වර්ධනය කිරීමේ සහ වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා ප්‍රජාවගේ යහපත පිණිස වන්නේ යයි සංස්ථාව සලකන සියලු දේ කිරීම ;

(ග) ඉහත කී කාර්යයන් කිසිවක් සඳහා, සංස්ථාගත කරනු ලැබූ හෝ නොලැබූ ද ශ්‍රී ලංකාවෙහි හෝ ඉන් බැහැරවූ ද යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් සමග එක්ව හෝ සහයෝගයෙන් කටයුතු කිරීම ;" ;

(2) එම වගන්තියේ (ග) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේද එකතු කිරීමෙන් :—

"(ච) රූපවාහිනී ග්‍රාහක යන්ත්‍ර සන්තකයේ තබා ගැනීම හා භාවිත කිරීම සඳහා IVඅ කොටස යටතේ බලපත්‍ර නිකුත් කිරීම හා අලුත් කිරීම සහ ඒ බලපත්‍ර නිකුත් කිරීම හා අලුත් කිරීම සඳහා නියෝජිතයන් පත් කිරීම සහ ඒ බලපත්‍ර ලබාගෙන ඇති බවට සහ අලුත් කර ගෙන ඇති බවට වගබලා ගැනීම; සහ

(ජ) රූපවාහිනී ග්‍රාහක යන්ත්‍ර ආනයනය කිරීමේ, විකිණීමේ, නිෂ්පාදනය කිරීමේ හෝ කොටස් එකලස් කිරීමේ යෙදී සිටින සියලු තැනැත්තන් ගෙන් ඒ යන්ත්‍ර එසේ ආනයනය කිරීම, විකිණීම, නිෂ්පාදනය කිරීම හෝ කොටස් එකලස් කිරීම පිළිබඳ තොරතුරු සහ වාර්තා ලබා ගැනීම. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 8අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

" නියෝජිතයන් පත් කිරීම.

8අ. මේ පනතේ IVඅ කොටස යටතේ බලපත්‍ර නිකුත් කිරීමේ හා අලුත් කිරීමේ කාර්ය සඳහා, සංස්ථාවේ නියෝජිතයකු ලෙස, සංස්ථාගත කරනු ලැබූ හෝ නොලැබූ තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක්, සංස්ථාව විසින් කලින් කල පත් කළ හැකි අතර සංස්ථාව සහ ඒ නියෝජිතයා එකඟ වන ආකාරයෙන් සංස්ථාව විසින් ඒ නියෝජිතයාට පාරිශ්‍රමික ගෙවිය හැකි ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උප වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (ඇඇ) 30අ වගන්තිය යටතේ අරමුදලට බැර කරනු ලබන සියලු මුදල් ; ";

(2) ඒ උපවගන්තියේ (ඈ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

" (ඈ) රූපවාහිනී බලපත්‍ර නිකුත් කිරීම හා අලුත් කිරීම සඳහා එක් එක් වර්ෂයේ දී ලැබෙන ගාස්තු අතුරින්, අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලබන කොටසක් ; ";

(3) ඒ උපවගන්තියේ (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (ඈඈ) මේ පනතේ IVඅ කොටස යටතේ ලියාපදිංචි කිරීමේ සහතික නිකුත් කිරීම සඳහා ගාස්තු වශයෙන් එක් එක් වර්ෂයේ දී ලැබෙන සියලු මුදල් ; සහ ; ".

අලුත් IVඅ කොටස ප්‍රධාන ප්‍රඥප්තියේ ඇතුළත් කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ IV කොටසට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ IVඅ කොටස ලෙස බලපැවැත්විය යුතු ය :—

"IVඅ කොටස

බලපත්‍ර නිකුත් කිරීම සහ ලියාපදිංචි කිරීම

රූපවාහිනී ග්‍රාහක යන්ත්‍ර සන්තකයේ තබා ගැනීම සහ භාවිත කිරීම පිළිබඳ තහනම.

16අ. (1) තත් කාර්යය සඳහා සංස්ථාව නිකුත් කළ බලපත්‍රයක බලය යටතේ හැර, කිසිම තැනැත්තකු විසින් අදාළ දිනයේදී හෝ ඉන් පසුව යම් රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රයක් තම සන්තකයේ තබා ගැනීම හෝ භාවිත කිරීම හෝ නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නියමයන්—

(අ) පාඨශාලාවක්, උසස් අධ්‍යාපන ආයතනයක් හෝ වෙනත් යම් ආයතනයක් තුළ ප්‍රජාවගේ යහපතට ඉවහල් වන සමාජ හෝ අධ්‍යාපනික අධ්‍යයන කටයුතු කර ගෙන යනු ලැබීම සැලකිල්ලට ගෙන, මේ වගන්තියේ කාර්ය සඳහා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන එවැනි ආයතනයක යම් තැනැත්තකු විසින් රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රයක් තබා ගැනීම හෝ භාවිත කිරීම ;

(ආ) මේ පනතේ 16ක වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ සහ ඒ වගන්තිය යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක් දරන යම් රූපවාහිනී ග්‍රාහක යන්ත්‍ර ආනයනකරුවකු, වෙළෙන්දකු, නිෂ්පාදකයකු හෝ කොටස් එකලස් කරන්නකු විසින් ඒ ආනයනකරු, වෙළෙන්දා, නිෂ්පාදකයා හෝ කොටස් එකලස් කරන්නා වශයෙන් තම ව්‍යාපාරය කර ගෙන යාමේදී රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රයක් තම සන්තකයේ තබා ගැනීම සහ භාවිත කිරීම ;

(ඇ) රූපවාහිනී ග්‍රාහක යන්ත්‍ර අලුත්වැඩියා කරන්නකු විසින් රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රයක් ඒ අලුත්වැඩියා කරන්නා වශයෙන් තම ව්‍යාපාරය කරගෙන යාමේ දී තම සන්තකයේ තබා ගැනීම සහ භාවිත කිරීම ;

(ඈ) රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රයක් සඳහා මේ කොටස යටතේ නිකුත් කරන ලද බල පත්‍රයක් දරන්නකුගේ ප්‍රකාශිත හෝ ගම්‍යමාන අවසරය ඇතිව හෝ උපදෙස් මත, ඒ බලපත්‍රයේ සඳහන් ස්ථානයේදී, යම් තැනැත්තකු විසින් ඒ යන්ත්‍රය භාවිත කිරීම ;

(ඉ) සංස්ථාවේ හෝ, අමාත්‍යවරයා විසින් 28 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බල පත්‍රයක් යටතේ පිහිටුවා පවත්වාගෙන යන වෙනත් පෞද්ගලික රූපවාහිනී ප්‍රචාරක මධ්‍යස්ථානයක හෝ, සේවයේ නියුක්තව සිටින යම් තැනැත්තකු විසින් එම සංස්ථාවේ හෝ මධ්‍යස්ථානයේ කාර්ය සඳහා යම් රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රයක් තම සන්තකයේ තබා ගැනීම හා භාවිත කිරීම

සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(3) (අ) රූපවාහිනී ග්‍රාහක යන්ත්‍ර කීපයක් යම් ස්ථාන වර්ගයක භාවිතා කිරීමට ඉඩ ඇති බව අමාත්‍යවරයා විසින් සලකනු ලබන අවස්ථාවක ඒ ස්ථාන වර්ගය සම්බන්ධයෙන් මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු බව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍ය වරයා විසින් ප්‍රකාශ කළ හැකි ය.

(ආ) මේ වගන්තිය අදාළ වන ස්ථාන වර්ගයකට ඇතුළත් වන යම් ස්ථානයක අයිතිකරු විසින්, ඒ ස්ථානයේ සවිකර ඇති සෑම රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රයක් ම සම්බන්ධයෙන් බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීම වෙනුවට ඒ ස්ථානය සම්බන්ධ යෙන් බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කළ හැකි ය. මේ උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලුම් පත්‍රයක් ම නියමිත ගාස්තුව සමග ඉදිරිපත් කළ යුතු ය. ඒ ඒ ස්ථාන වර්ගයේ භාවිත කිරීමට ඉඩ ඇති රූපවාහිනී ග්‍රාහක යන්ත්‍ර සංඛ්‍යාව සැලකිල්ලට ගෙන, විවිධ ස්ථාන වර්ග සඳහා විවිධ ගාස්තු ප්‍රමාණ නියම කළ හැකි ය.

(ඇ) (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍ර ඉල්ලුම් කිරීම, නිකුත් කිරීම හා අලුත් කිරීම කෙරෙහි හා ඒ සම්බන්ධයෙන් 16ඇ, 16ඈ, 16ඉ හා 16ඊ වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(ඈ) මේ වගන්තිය යටතේ යම් ස්ථානයක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද බල පත්‍රයක් බලාත්මකව පවතින අවස්ථාවක, යම් තැනැත්තකු විසින් ඒ ස්ථානයේ රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රයක් තම සන්තකයේ තබා ගැනීම හෝ භාවිත කිරීම 16ඇ වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ කෙරෙන ලෙස සැලකිය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා "උසස් අධ්‍යාපන ආයතනය" යන්නට 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ දී ඇති අර්ථය ම ඇත්තේ ය.

අදාළ දිනයට පෙර රූපවාහිනී ග්‍රාහක යන්ත්‍ර සන්තකව සිටි සහ භාවිත කළ තැනැත්තන්ගේ අයිතිවාසිකම්.

16ආ. 16අ වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වී තිබුණ ද, අදාළ දිනයට පෙරාතුව ම රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රයක් සන්තකව සිටි යම් තැනැත්තකුට, අදාළ දින යෙන් ආරම්භවන මාස තුනක කාලසීමාවක් ඒ වෙනුවෙන් බලපත්‍රයක් ලබා නොගෙන, ඒ රූප වාහිනී ග්‍රාහක යන්ත්‍රය තම සන්තකයෙහි තබා ගැනීමේ හා භාවිත කිරීමේ අයිතිවාසිකම තිබිය යුතු ය.

බලපත්‍රයක් නිකුත් කිරීම.

16ඇ. (1) නියමිත විස්තර ඇතුළත් වූ ද නියමිත ආකෘතියේ වූ ද ඉල්ලීමක් කරනු ලැබූ විට සහ නියමිත ගාස්තුව ගෙවනු ලැබූ විට, සංස්ථාව විසින් හෝ යම් නියෝජිතයකු විසින් ඒ ඉල්ලුම්කරුට රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රයක් තම සන්තකයේ තබා ගැනීම සහ භාවිත කිරීම සඳහා බලය පවරන බලපත්‍රයක් ඒ රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රය සඳහා නිකුත් කළ යුතු ය.

(2) මේ කොටස යටතේ යම් රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රයක් සම්බන්ධයෙන් බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක් ම නියමිත ආකෘතිය මඟින් සංස්ථාව වෙත හෝ යම් නියෝජිතයකු වෙත හෝ ඉදිරිපත් කළ යුතු අතර එහි නියමිත විස්තර ඇතුළත් විය යුතු ය.

(3) මේ කොටස යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම—

(අ) නියමිත ආකෘතියෙහි විය යුතු ය;

(ආ) අවුරුදු එකක කාල සීමාවක් සඳහා වලංගු විය යුතු ය; සහ

(ඇ) බලපත්‍රයේ සඳහන් කාලසීමාව ඉකුත් වූ විට අලුත් කරනු ලැබිය හැකි විය යුතු ය.

බලපත්‍රයේ නියම හා කොන්දේසි.

16ඈ. මේ කොටස යටතේ යම් රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රයක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, ඒ බලපත්‍රය භාවිත කිරීම සහ පැවතීම සම්බන්ධයෙන් නියම කරනු ලබන නියම වලට හා කොන්දේසිවලට යටත් විය යුතු ය.

ඉල්ලුම් පත්‍රයේ ඇතුළත් විස්තරවල යම් වෙනසක් ගැන දැනුම් දිය යුතු බව.

16ඉ. සෑම බලපත්‍රධාරියකු ම විසින්, මේ කොටස යටතේ තම බලපත්‍රය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ ඉල්ලුම්පත්‍රයේ සඳහන් විස්තරවල යම් වෙනසක් සිදු වූ අවස්ථාවක, ඒ වෙනස සිදු වී දින තිහක් ඇතුළත, ඒ ගැන සංස්ථාවට හෝ නියෝජිතයාට ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

බලපත්‍ර අලුත් කිරීම.

16ඊ. (1) යම් බලපත්‍රයක් අලුත් කිරීම සඳහා නියමිත ආකෘතියක් මගින් කරන ලද ඉල්ලීමක් මත සහ නියමිත ගාස්තුව ගෙවනු ලැබූ විට, සංස්ථාව විසින් හෝ යම් නියෝජිතයකු විසින්, 16ඈ වගන්තිය යටතේ නිකුත් කළ යම් බලපත්‍රයක් අලුත් කරනු ලැබිය හැකි අතර අලුත් කරන ලද බලපත්‍රය එහි සඳහන් දිනයේ සිට අවුරුදු එකක කාල සීමාවක් සඳහා වලංගු විය යුතු ය.

(2) මේ කොටස යටතේ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම ඒ බලපත්‍රයෙහි කාලය ඉකුත් වීමේ දිනයට පෙර මාස තුනක් ඇතුළත නියමිත ආකෘතිය මගින් සංස්ථාව වෙත හෝ යම් නියෝජිතයකු වෙත ඉදිරිපත් කළ යුතු ය.

සංස්ථාව විසින් බලපත්‍ර ගාස්තුවලින් කොටසක් රජයෙන් පාලනය වන යම් රූපවාහිනී ප්‍රචාරක මධ්‍යස්ථානයකට ගෙවිය යුතු බව.

16උ. රූපවාහිනී බලපත්‍ර නිකුත් කිරීම සහ අලුත් කිරීම සඳහා සංස්ථාවට ලැබුණු ගාස්තු වලින් 13 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි සඳහන් මුදල් සංස්ථාවේ අරමුදලට ගෙවීමෙන් පසුව ඉතිරිවන කොටස, රජය වෙත සතු කරන ලද වෙනත් යම් රූපවාහිනී ප්‍රචාරක මධ්‍යස්ථානයකට සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු ය.

රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රයක් සඳහා බලපත්‍රයක් ලබා නොගෙන, ඒ රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රය සන්තකයේ තබා ගැනීම හෝ භාවිත කිරීම පිළිබඳ සහ බලපත්‍රවල නියම සහ කොන්දේසි උල්ලංඝනය කිරීම පිළිබඳ දණ්ඩනය.

16ඉ. (1) (අ) යම් රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රයක් සන්තකයේ තබා ගැනීම හෝ භාවිත කිරීම සඳහා මේ කොටස යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් නොමැතිව ඒ රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රය තම සන්තකයේ තබාගෙන සිටින හෝ භාවිත කරන ; හෝ

(ආ) මේ කොටස යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක යම් නියමයක් හෝ කොන්දේසියක් උල්ලංඝනය කරමින් ක්‍රියා කිරීම හෝ ඊට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් කරන්නකු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලසීමාවකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු යම් වරදකට වරදකරු කරනු ලැබූ විට, මහෙස්ත්‍රාත්වරයා විසින්, ඒ උපවගන්තිය යටතේ නියම කරනු ලබන යම් දණ්ඩනයකට අමතරව,—

(අ) වරද කරන ලද්දේ යම් රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රයක් සම්බන්ධයෙන් ද ඒ රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රය සඳහා මේ කොටස යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් තිබේ නම්, එය අවලංගු කරන ලෙස ; සහ

(ආ) වරද කරන ලද්දේ යම් රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රයක් සම්බන්ධයෙන් ද ඒ රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රය හෝ වරද කිරීමෙහිලා හෝ ඒ වරද කිරීම සම්බන්ධයෙන් හෝ භාවිත කරන ලද රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රය රාජ්‍ය සන්තක කරන ලෙස

ආඥා කළ හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ රාජ්‍ය සන්තක කරන ලද යම් රූපවාහිනී ග්‍රාහක යන්ත්‍ර යක්, එසේ රාජ්‍ය සන්තක කිරීමෙන් පසු නිරව ශේෂයෙන්ම රජය සන්තක වන්නේ ය. ඒ සන්තකවීම—

(අ) මහේස්ත්‍රාත්වරයාගේ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචන යක් ඉදිරිපත් කළ හැකි කාල සීමාව ඉකුත් වූ විට ; හෝ

(ආ) මහේස්ත්‍රාත්වරයාගේ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචන යක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක, රාජ්‍ය සන්තක කිරීමේ ආඥාව ස්ථිර කරමින් හෝ අනුමත කරමින් ඒ අභියා චනය පිළිබඳව තීරණයක් කරනු ලැබූ විට

බලාත්මක විය යුතු ය.

බලපත්‍ර ගාස්තුව ගෙවා නොමැති අවස්ථාවක, අධිභාරයක් අය කිරීම.

16ඒ. 16ඇ වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක සඳහන් කාලය ඉකුත්වීමේ දින යෙන් පසු, යම් තැනැත්තකු විසින් ඒ බලපත්‍රය අලුත් කිරීම සඳහා සංස්ථාව වෙත හෝ යම් නියෝජිතයකු වෙත ඉල්ලීමක් කරන ලද අවස්ථා වක, නියමිත ප්‍රමාණයක වූ අධිභාරයක් ඉල්ලුම් කරු විසින් ගෙවනු ලැබීමට යටත්ව, සංස්ථාව විසින් හෝ ඒ නියෝජිතයා විසින් ඒ බලපත්‍රය අලුත් කළ හැකි ය. එසේ නියම කරනු ලබන උපරිම අධිභාර ප්‍රමාණය ඒ බලපත්‍රය අලුත් කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තුවෙන් සියයට දහයක් නොඉක්මවිය යුතු ය.

ලියාපදිංචි කිරීමේ සහතිකය නොමැතිව රූපවාහිනී ග්‍රාහක යන්ත්‍ර ආනයනය කිරීම, විකිණීම ආදී ව්‍යාපාරවල යෙදීම තහනම් බව.

16ඔ. (1) අදාළ දිනයේ දී හෝ ඉන්පසුව කිසිම තැනැත්තකු යම් රූපවාහිනී ග්‍රාහක යන් ත්‍රයක් ආනයනය කිරීමේ, නිෂ්පාදනය කිරීමේ හෝ කොටස් එකලස් කිරීමේ ව්‍යාපාරය කර ගෙන යාම, ඊට කාර්යය සඳහා සංස්ථාව විසින් නිකුත් කරන ලද ලියා පදිංචි කිරීමේ සහතිකයක බලය යටතේ මිස, නොකළ යුතු ය.

(2) රූපවාහිනී ප්‍රචාරක මධ්‍යස්ථානයක් පිහි ටුවා පවත්වාගෙන යාම සඳහා 28 වන වගන් තිය යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තකු විසින් රූපවාහිනී ග්‍රාහක යන් ත්‍රයක් ආනයනය කිරීම, විකිණීම, නිෂ්පාදනය කිරීම හෝ රූපවාහිනී ග්‍රාහක යන්ත්‍ර කොටස් එකලස් කිරීම සම්බන්ධයෙන් (1) වන උප වගන්තියේ නියම අදාළ නොවිය යුතු ය.

අදාළ දිනයට පෙර ව්‍යාපාරය කර ගෙන ගිය තැනැත්තන්.

16ඕ. 16ඔ වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වී තිබුණ ද, අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයේදී රූපවාහිනී ග්‍රාහක යන්ත්‍ර ආනයනය කිරීමේ, විකිණීමේ, නිෂ්පාදනය කිරීමේ හෝ කොටස් එකලස් කිරීමේ ව්‍යාපාරය කරගෙන ගිය යම් තැනැත්තකුට අදාළ දිනයෙන් ආරම්භ වන මාස තුනක කාල සීමාවක් තුළ මේ කොටස යටතේ නිකුත් කරනු ලබන ලියාපදිංචි කිරීමේ සහතික යක් නොමැතිව ඒ ව්‍යාපාරය කරගෙන යාමට හිමිකම් ඇත්තේ ය.

රූපවාහිනී ග්‍රාහක යන්ත්‍ර ආනයනය කිරීම ආදී ව්‍යාපාරය කර ගෙන යන තැනැත්තන් ලියාපදිංචි කිරීම.

16ක. (අ) ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන්නේ යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ද ඒ ව්‍යාපාරයට අදාළව, (149 වන අධිකාරය වූ) ව්‍යාපාර නාම ආඥාපනත යටතේ නිකුත් කරන ලද ලියා පදිංචි කිරීමේ සහතිකයේ සහතික පිටපතක් ද සමඟ නියමිත ආකෘතියේ වූ ඉල්ලීමක් තත් කාර්යය සඳහා ලැබුණු විට ; සහ

(ආ) නියමිත ගාස්තුව ගෙවනු ලැබූ විට සංස්ථාව විසින් යම් තැනැත්තකු සංස්ථාවේ ලියා පදිංචි කළ යුතු අතර, එකී ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ යම් රූපවාහිනී ග්‍රාහක යන්ත්‍ර ආනයනය කිරීමේ, විකිණීමේ, නිෂ්පාදනය කිරීමේ හෝ කොටස් එකලස් කිරීමේ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ද

ඒ ව්‍යාපාරය කරගෙන යාමට ඒ තැනැත්තාට බලය දෙන සහතිකයක් ඒ තැනැත්තාට නිකුත් කළ යුතු ය.

ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීමක් කිරීම.

16ග. මේ කොටස යටතේ ලියාපදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම නියමිත විස්තර සහිතව නියමිත ආකෘති පත්‍රයෙහි සංස්ථාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන්නේ යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ද ඒ ව්‍යාපාරයට අදාළව, (149 වන අධිකාරය වූ) ව්‍යාපාර නාම ආඥාපනත යටතේ නිකුත් කරන ලද ලියා පදිංචි කිරීමේ සහතිකයේ සහතික පිටපතක් ද ඒ සමඟ ඉදිරිපත් කළ යුතු ය.

ලියාපදිංචි කිරීමේ සහතිකයේ නියම සහ කොන්දේසි.

16ජ. මේ කොටස යටතේ නිකුත් කරනු ලබන සෑම ලියාපදිංචි කිරීමේ සහතිකයක් ම මෙහි උප ලේඛනයේ දක්වා ඇති නියමවලට සහ කොන්දේසිවලට යටත් විය යුතු ය.

ලියාපදිංචි කිරීමේ සහතියක් නොමැතිව රූපවාහිනී ග්‍රාහක යන්ත්‍ර ආනයනය කිරීමේ, විකිණීමේ ආදී ව්‍යාපාරයක් කරගෙන යාම පිළිබඳව සහ ලියාපදිංචි කිරීමේ සහතිකයක යම් නියම සහ කොන්දේසි උල්ලංඝනය කිරීම පිළිබඳව දණ්ඩනය.

16ට. (1) (අ) රූපවාහිනී ග්‍රාහක යන්ත්‍ර ආනයනය කිරීමේ, විකිණීමේ, නිෂ්පාදනය කිරීමේ හෝ ඒ කොටස් එකලස් කිරීමේ ව්‍යාපාරය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් නොමැතිව ඒ ව්‍යාපාරය කර ගෙන යාම ;

(ආ) මේ කොටස යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක යම් නියම හෝ කොන්දේසි උල්ලංඝනය කරන හෝ ඊට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින

යම් තැනැත්තකු වරදක් කරන්නකු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් හත්දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස දහඅටක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(2) යම් තැනැත්තකු (1) වන උපවගන්තිය යටතේ යම් වරදක් සඳහා වරදකරු කරනු ලැබූ විට, මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ උපවගන්තිය යටතේ නියම කරනු ලබන යම් දඬුවමකට අමතරව, ඔහු විසින් වරදේ බරපතලකම සැලකිල්ලට ගෙන,—

(අ) වරද සිදු කරන ලද්දේ යම් ලියාපදිංචි කිරීමේ සහතිකයක් සම්බන්ධයෙන් ද ඒ ලියාපදිංචි කිරීමේ සහතිකය, ආඥාවේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලයක් සඳහා අත්හිටුවමින් ; හෝ

(ආ) ඒ ලියාපදිංචි කිරීමේ සහතිකය අවලංගු කරමින්

ආඥාවක් කරනු ලැබිය හැකි ය.

සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි සම්බන්ධයෙන් ඇතැම් තැනැත්තන් ගේ වගකීම.

16ඩ. පුද්ගල මණ්ඩලයක් විසින් මේ කොටස යටතේ වරදක් කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ වරද සිදු කරන ලද අවස්ථාවේ ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු, සාමාන්‍යාධිකාරීවරයකු, ලේකම්වරයකු හෝ ඊට සමාන වෙනත් නිලධරයකු වූ සෑම තැනැත්තකු ම ; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම්, ඒ වරද සිදු කරන ලද අවස්ථාවේ ඒ ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවකු වූ සෑම තැනැත්තකු ම

ඒ වරද සිදු කරන ලද්දේ තමාගේ දැනුම හෝ ගුප්තානුකූලතාව නොමැතිව බව ද, සියලුම අවස්ථාගත කරුණු යටතේ තමාගේ කර්තව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගැනීමේ දී තමා විසින් යෙදිය යුතු වූ සම්පූර්ණ උද්යෝගය ඒ වරද කිරීම වැළැක්වීම සඳහා යෙදූ බව ද ඔප්පු කළහොත් මිස, ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.''.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 21අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:— *ප්‍රධාන ප්‍රඥප්තියේ 21අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.*

*'' මහේස්ත්‍රාත් වරයා විසින් සෝදිසි වරෙන්තු නිකුත් කළහැකි බව.*

21අ. (1) යම් මහෙස්ත්‍රාත්වරයකුගේ අධිකරණ බලසීමාව ඇතුළත යම් ස්ථානයක මේ පනතේ විධිවිධාන කඩ කරමින්,—

(අ) යම් තැනැත්තකු යම් රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රයක් තම සන්තකයේ තබාගෙන සහ භාවිත කරමින් සිටින බවට;

(ආ) යම් තැනැත්තකු රූපවාහිනී ග්‍රාහක යන්ත්‍ර ආනයනය කිරීමේ, විකිණීමේ, නිෂ්පාදනය කිරීමේ හෝ කොටස් එකලස් කිරීමේ ව්‍යාපාරය කරගෙන යන බව

විශ්වාස කිරීමට දිවුරුම් පිට සපයන ලද තොරතුරු මත, සාධාරණ හේතු ඇතැයි ඒ මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත් වුවහොත්, ඒ ස්ථානයට ඇතුළු වී එහි සිට හමුවන යම් තැනැත්තකුගෙන් කරුණු විමසීම පිණිස සහ ඒ කඩකිරීම සිදු කරනු ලබන්නේ යම් රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රයක් සම්බන්ධයෙන් ද ඒ රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රය තහනමට ගැනීම පිණිස, සංස්ථාවේ යම් නිලධරයකුට සෝදිසි වරෙන්තුවක් ඒ මහෙස්ත්‍රාත් වරයා විසින් නිකුත් කළ හැකි ය.

(2) සංස්ථාවේ නිලධරයකු විසින් (1) වන උපවගන්තිය යටතේ යම් රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රයක් තහනමට ගත් අවස්ථාවක, ඒ රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රය එසේ තහනමට ගනු ලැබුවේ යම් මහෙස්ත්‍රාත්වරයකුගේ අධිකරණ බලසීමාව ඇතුළත දී ද ඒ මහෙස්ත්‍රාත්වරයා වෙත, ඒ නිලධරයා විසින් දින හතක කාලසීමාව ඇතුළත, ඒ රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රය ඉදිරිපත් කළ යුතු අතර

එසේ ඒ රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රය ඉදිරිපත් කරනු ලැබූ විට, අධිකරණය විසින් ඒ රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රයේ භාරකාරත්වය පිළිබඳව සුදුසු යයි සලකනු ලබන ආඥාවක් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක්" යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට ප්‍රකාශිතවම අන්‍යාකාර විධිවිධාන සලස්වා තිබේ නම් මිස, රුපියල් පන්සියයක්" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

30අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ ඇතුළත් කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 30අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

"දඩ අයකර ගත් පසු, ඉන් තුනෙන් දෙකක් සංස්ථාවේ අරමුදලට බැර කළ යුතු බව.

30අ. මේ පනත යටතේ යම් වරදක් සඳහා නියම කරනු ලබන දඩ අයකර ගත් පසු ඒ සියලු දඩවලින් තුනෙන් දෙකක් සංස්ථාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) "නියමිත" යන්නෙහි අර්ථකථනයට පෙරාතුවම පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

"නියෝජිතයා" යන්න මේ පනතේ IV කොටස යටතේ වූ බලපත්‍රයකට අදාළ යම් පද සම්බන්ධයක දී යෙදුනු විට, ඉන් මේ පනතේ 8 වන වගන්තිය යටතේ සංස්ථාව විසින් නියෝජිතයකු වශයෙන් පත් කරන ලද, සංස්ථාගත කරනු ලැබූ හෝ නොලැබූ, යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ ;

"ස්ථානය" යන්නෙන්, යම් ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිල්ලක කොටසක්, ඊට අනුබද්ධ ඉඩම ද සහිතව, අදහස් වේ ;

(2) "පුද්ගලික රූපවාහිනී ප්‍රචාරක මධ්‍යස්ථානය" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

"අදාළ දිනය" යන්නෙන්, මේ පනතේ IV අ කොටස ක්‍රියාත්මක වන දිනය අදහස් වේ ;

(3) "රූපවාහිනී වැඩ සටහන හෝ වැඩ සටහන්" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

"රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රය" යන්නෙන්, සම්ප්‍රේෂිත අනුකූලිත ගුවන් විදුලි සංඛ්‍යාත සංඥා ලබා ගැනීමට හා සමකාලිකාත දෘශ්‍ය රූප හා ශබ්දය නිපදවීමට භාවිත කෙරෙන උපකරණයක් අදහස් වේ.

**11.** අදාළ දිනයේ සිට හා ඉන් පසු බලපත්‍ර සම්බන්ධයෙන් විදුලි සංදේශ ආඥාපනතේ ඇතුළත් විධිවිධාන, රූපවාහිනී ග්‍රාහක යන්ත්‍ර ආනයනය කිරීමට, විකිණීමට, නිෂ්පාදනය කිරීමට, ඒවායේ කොටස් එකලස් කිරීමට, ඒවා සන්තකයේ තබා ගැනීමට හෝ භාවිතා කිරීමට හෝ ඒ සම්බන්ධයෙන් හෝ අදාළ නොවිය යුතු ය. විදුලි සංදේශ ආඥාපනතේ ඇතැම් විධිවිධාන අදාළ නොවීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපලේඛනය මෙයින් එකතු කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් උපලේඛනයක් එකතු කිරීම.

"උපලේඛනය (16ජ වන වගන්තිය)

16ජ වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන ලියාපදිංචි කිරීමේ සහතිකයේ නියම සහ කොන්දේසි :—

1. ලියාපදිංචි කිරීමේ සහතිකය අන්සතු නොකළ යුතු ය.

2. ලියාපදිංචි කිරීමේ සහතිකය අදාළ ව්‍යාපාර ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කර තැබිය යුතු ය.

3. සෑම ලියාපදිංචි කිරීමේ සහතිකපත්‍රධාරියකු විසින් නියමිත ආකෘතියේ වූ ලේඛනයක් තබාගෙන, පවත්වාගෙන යා යුතු අතර ඔහුගේ ව්‍යාපාරය සම්බන්ධ සෑම ගනුදෙනුවක් පිළිබඳව විස්තර එහි ඇතුළත් කිරීම හෝ ඇතුළත් කිරීමට සැලැස්වීම හෝ කළ යුතු ය.

4. එසේ තබාගෙන පවත්වාගෙන යනු ලබන එකී සෑම ලේඛනයක්ම සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තත් කාර්යය සඳහා බලය දෙන ලද යම් නිලධරයකු විසින් පරීක්ෂා කරනු ලැබිය හැකි පරිදි තබා තිබිය යුතු ය.

5. (1) තම ව්‍යාපාරය සම්බන්ධයෙන් වාර්තා සහ වෙනත් තොරතුරු සංස්ථාවට සපයන ලෙස සංස්ථාව විසින් තමාට නියම කරනු ලැබූ විට සෑම ලියාපදිංචි කිරීමේ සහතිකපත්‍රධාරියකුම එසේ ඒවා ඉදිරිපත් කළ යුතු ය.

(2) පෙරකුව වූ ඡේදය යටතේ සපයන ලද සෑම වාර්තාවක්ම එහි ඇතුළත් විස්තර සත්‍ය හා නිවැරදි බවට වූ ප්‍රකාශනයක් මගින් සත්‍යායනය කරනු ලැබිය යුතු ය.

6. සෑම ලියාපදිංචි කිරීමේ සහතිකපත්‍රධාරියකුම විසින් ලියාපදිංචි කිරීම සඳහා ඔහු ඉදිරිපත් කළ ඉල්ලුම් පත්‍රයේ සඳහන් විස්තරවල යම් වෙනසක් සිදුවීමෙන් දින තිහක් ඇතුළත, ඒ වෙනස පිළිබඳව සංස්ථාවට ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

7. සෑම ලියාපදිංචි කිරීමේ සහතිකපත්‍රධාරියකුම විසින් ඒ ගණුදෙනුව කළේ යම් තැනැත්තකු සමග ද එසේ නැතහොත් යම් තැනැත්තකු වෙනුවෙන් ද ඒ තැනැත්තාට තම අත්සන සහිත ලදුපත් නිකුත් කළ යුතු අතර ඒ ලදුපතේ—

(අ) ඒ තැනැත්තාගේ නම සහ රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රය තබා ගන්නා ස්ථානයෙහි විස්තරය සහ ලිපිනය සහ එය තබා ගන්නා වාහනයේ වර්ගය සහ ලියාපදිංචි අංකය;

(ආ) ගණුදෙනුවේ ස්වභාවය;

(ඇ) ගණුදෙනුව කළේ යම් රූපවාහිනී ග්‍රාහක යන්ත්‍රයක් හෝ යන්ත්‍ර සම්බන්ධයෙන් ද ඒ යන්ත්‍රයේ හෝ යන්ත්‍රවල වර්ගය සහ අංකය;

(ඈ) ගණුදෙනුව කළ දිනය;

තවද ඔහු විසින් එවැනි සෑම ලදුපතකම පිටපතක් තබාගත යුතු අතර, සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ ඒ කාර්ය සඳහා ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් ඉල්ලා සිටින ලද විට එය ඉදිරිපත් කළ යුතු ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 12 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.